# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1644/28 - 2010 මාර්තු 11 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

64(5) වන වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

පිළිගත් දේශපාලන පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂය විසින් නාමයෝජනා කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත් කර ගන්නා ලද බවට ප්‍රකාශයට පත් කරන ලද මීරා මොහිදීන් මොහොමඩ් මුස්තාපා මහතා පක්ෂ සාමාජිකත්වයෙන් පහ කිරීම හේතුකොට ගෙන සයවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ වැඩ බලන මහ ලේකම් විසින් මා වෙත දැනුම් දී ඇති හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස එම දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාම යෝජනා කරන ලෙස මා විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මීරා මොහිදීන් මොහොමඩ් මුස්තාපා මහතා යෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක වන මම, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් මීරා මොහිදීන් මොහොමඩ් මුස්තාපා මහතා ඉහත කී පක්ෂයෙන් පහ කිරීම හේතු කොටගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා මීරා මොහිදීන් මොහොමඩ් මුස්තාපා මහතා සයවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දයානන්ද දිසානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 මාර්තු මස 11 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරියේ දී ය.

03-866

1A - G 12594— 700 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.